## 434 සාමයෙ කුමරුවනේ

සාමයෙ කුමරුවනේ ඔබගේ උපත් දිනේ
සාමයෙ පණිවුඩයේ අහසේ රැව් දුන්නේ
මහිමේ උස් මඬලේ දෙවිඳේ
ඔබ හට හිම්වේවා
සුසින් දනන් දෙරණ පිටේ
සාමය අත්වේවා

යහපත සලසා දෙමින් ගියේ
ජීවිතෙ ඔබෙ වියදම් කෙරුවෝ
වෙහෙසෙන්නන් ළං කැරැ ගත්තෝ
සාමෙ නමින් ඔබ දිවි පිදුවෝ

මරුගේ විස දළ බිඳ දැම්මෝ
මළවුන්ගෙන් උත්ථාන වුණෝ
බිය සැක සතුන්ගෙ දුරු කෙරුවෝ
සැමට මැ සාමය සෙත පැතුවෝ

යම් සාමය ඔබ ළඟ මැ තබා
දෙම් මගෙ සාමය ඔබ'තැ ඔබා
නො දෙනෙමි ඒ ලොව දෙන ලෙසටා
ඔබ හට පවරා දෙම් වෙසෙසා

ඇපවෙමු කැපවෙමු පින්වතුනේ
සාමෙ පිණිසැ දෙවි ගෙවා අපේ
වැඩ කරනට අප හෙළ දීපේ
වැසි උරුමෙට එ පින ඇතේ